# සීනිගම දියඹ දේවාලයේ කළු අභිචාර පිළිබඳ විමර්ශනයක්

එල්.එම්.සී.එස්.පී. ලන්දේකුඹුර[1]

බුද්ධිය යටපත් කර භක්තිය හිස ඔසවන දේවාල පසුබිම තුළ සීනිගම හෙවත් දියඹ දේවාලයට හිමි වන්නේ සුවිශේෂි ස්ථානයකි. බොහෝමයක් බැතිමතුන්ගේ පහස ලද මෙකී පුදබිමේ නාමය කන වැටෙත්ම සිහියට නැඟෙනුයේ දෙස් දෙවොල් පූජාවන්ය. සීනිගම එතරම් ප්‍රසිද්ධියට පත් වූයේ මෙකී අස්පර්ෂනීය වූ උරුම නිසාය. දෙවොල් දෙවියන් මුල් කරගත් පුදබිමක් වූත්, සතර දිශාවෙන් මහ සයුරෙන් වට වූත් දියඹ දෙවොල විශේෂයෙන්ම කළු අභිචාර උදෙසා වෙන් වූවකි. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ සීනිගම දෙවොල් දේවාලය ආශ්‍රීතව පවතින කළු අභිචාර පිළිබඳ අධ්‍යයනය කිරීමය. අධ්‍යයනය ගැටළුව වනූයේ සීනිගම දෙවොල් දේවාලයෙන් පිළිබිඹු වන කළු අභිචාරයන් හා ඒ හා සබැඳි චාරිත්‍ර කෙබඳු ද යන්න විමසීමය. අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය හා සංධාර අධ්‍යයනය සිදු කරන ලදි. දෙවොල් දෙවියන් අධිගෘහිත මෙම දේවාල පසුබිම තුළ ශාන්ති කර්ම හා අවලාද යනුවෙන් යාතු කර්ම දෙකක් සිදු වේ. මෙකී යාතු කර්ම ද්විත්වය ඇසුරෙන් වඩාත් ප්‍රකට වනූයේ අවලාද පූජාවන් හෙවත් කළු අභිචාරයන්ය. එනිසා දිවයිනේ සිව් දෙස නියෝජනය කරන ජනයා නොයෙක් අරමුණු මුදුන් පමුණුවා ගැනීමට මෙම පුදබිමට පැමිණේ. වසර 4700 ක පමණ ඉතිහාසයකට උරුමකම් කියන මෙම දේවාලය පීඩාවට පත්වූවන්ට නවාතැන්පලකි. නීතියෙන්, යුක්තියෙන් බැට කන සමාජ අසාධාරණය හමුවේ දෙවියන්ගෙන් හෝ පිළිසරණක්, සාධාරණයක් අපේක්ෂාවෙන් බොහෝමයක් බැතිමතුන් මෙම දේවාලයට පැමිණේ. අවලාද පූජාවන් සඳහා පැමිණෙන බැතිමතාගේ සිට යාතිකා කරන්නවුන්ගේ වාචික ප්‍රකාශන විටෙක ඇඟ හිරිගඬු මතුවන මනසට භීතියක් ගෙන දෙන්නකි. කළු අභිචාර සඳහා යොදාගන්නා වාග් මාලාව ද, උපකරණ ද ඊටම ආවේණික වූ ඒවා වේ. දෙවොල් දෙවියන් මුල්කරගත් දේව පිරිවර හා පරිවාර යක්ෂයන්ගෙන් තමන්ට වූ අසාධාරණය දේව සහාවෙන් විසදා දෙන ලෙස ඔවුන් විශ්වාස කරති. නමුත් වරදට දඬුවම මිස මරණයම අපේක්ෂා නොකරයි. මිරිස් ඇඹරීම, පොල් ගැසීම, සල්ලි කැපීම, හූනා ගැසීම ආදී නොයෙක් කළු අභිචාර පැවතුන ද නූතනය වන විට පවතින්නේ ඉන් අතලොස්සකි. මෙලෙස දුෂ්චේතනාවෙන් පැමිණෙන බැතිමතා හා යාතිකා කරන්නාට හිමි වනුයේ විශාල පාපයකි. එනිසා මෙය දැලි පිහියෙන් කිරි කන්නාක් මෙන් යැයි පැවසීම නිවැරදිය. ඒ අනුව සීනිගම දෙවොල් දේවාලය තුළ විවිධාකාර වූ කළු අභිචාරයන් හා ඒ සබැඳි චාරිත්‍ර පවතින බව අවසාන වශයෙන් නිගමනය විය.

ප්‍රමුඛ පද : සීනිගම දේවාලය, දෙවොල් දෙවියන්, කළු අභිචාර, දියඹ දේවාලය, අවලාද

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.sandunika1995chamari@gmail.com